**ශීර්ෂය 211 - රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 211 - රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 අගෝස්තු 23 දින රජයේ මුද්‍රණාලයාධිපතිවරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 2,002.00 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,841.83 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 160.17 ක් හෙවත් සියයට 8 ක් ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2016 දෙසැම්බර් 31දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | **රු.මිලියන** | **රු.මිලියන** | **රු.මිලියන** | |
| පුනරාවර්තන | 1,904.00 | 1,752.15 | 151.85 | 7.98 |
| මූලධන | 98.00 | 89.68 | 8.32 | 8.49 |
| එකතුව | 2,002.00 | 1,841.83 | 160.17 | 8.00 |

## 2.2 ආදායම් ගිණුම

**ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම**

දෙපාර්තමේන්තුව විසින් 2016 වර්ෂය සඳහා ආදායම් සංකේත 20-03-02-05 සඳහා එකතුව රු.මිලියන 500.00 ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 519.47 ක ආදායමක් රැස්කර තිබුණි. එය ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 104 ක් වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2016 දෙසැම්බර් 31දිනට | | | ඉක්මවීම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 20-03-02-05 | 500.00 | 519.47 | 19.47 | 3.89 |

## 2.3 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 21101 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 50.00 | 49.99 | 45.00 | 51.26 | 255.00 | 203.19 |

## 2.4 අග්‍රිම ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ වූ අංක 7002/0000/00/0104/0016/000 දරන අග්‍රිම ගිණුමෙහි 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 17.72 ක් විය.

## 2.5 පොදු තැන්පත් ගිණුම

දෙපාර්තමේන්තුව යටතේ 2016 දෙසැම්බර් 31 දිනට පොදු තැන්පත් ගිණුම් 3ක ශේෂවල එකතුව රු.මිලියන 71.92 ක් විය. විස්තර පහත දැක්වේ.

| තැන්පත් ගිණුම් අංකය | 2016 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- |
| | රු.මිලියන |
| 6000/0000/00/0013/0035/000 | 69.22 |
| 6000/0000/00/0018/0003/000 | 0.85 |
| 6000/0000/00/0002/0050/000 | 1.85 |
| | 71.92 |

## 2.6 විගණන නිරීක්ෂණය

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

## 3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

### 3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බැව් නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාළ රෙගුලාසිය |
| --- | --- | --- |
| (අ) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 211 (1) |
| (ආ) | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය | මුදල් රෙගුලාසි 1647 (ඉ) |

### 3.2 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු. 2,807,172 ක් වූ තැන්පතු 25 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

### 3.3 ආදායම් ගිණුම

දෙපාර්තමේන්තු ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරියා වශයෙන් ආදායම් සංකේතයක ආදායම් ඇස්තමේන්තු පිළියෙල කිරීම, ආදායම් රැස්කිරීම, ගිණුම්ගත කිරීම හා ගිණුම් ඉදිරිපත් කිරීමේ කාර්යභාරයන් පැවැරී තිබුණි. අංක 20-03-02-05 දරන ආදායම් සංකේතයට අදාළව සිදු කළ නියැදි විගණනයේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ඉදිරිපත් කළ ආදායම් ගිණුම අනුව එකතුව රු .මිලියන 558.34 ක් හිඟහිටිව තිබුණි. එම ශේෂය තුළ 1989 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා වර්ෂ 21 ක කාලපරිච්ඡේදයක සිට රු.මිලියන 202.93 ක් අයනොවී පැවතුනි. සමාලෝචිත වර්ෂය තුළදී ද කිසිදු මුදලක් අයකරගෙන නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් පෞද්ගලික ආයතනවලට සපයන ලද මුද්‍රණ කාර්යයන් වෙනුවෙන් අයවිය යුතු එකතු ණය ශේෂය රු 10,174,643 ක් විය. එම ශේෂයෙන් රු 931,096 ක එකතු ණය ශේෂයක් වසර 12 සිට 24 දක්වා කාලයක සිට හිඟ හිටිව පැවතිණි. එසේම 2014 වර්ෂයේ සිට හිඟහිටව පැවතෙණ රු. 9,243,546 ක ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයවී නොතිබුණි.

**3.4 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 21101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශනය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) මිය ගිය, වැඩ තහනම් කළ, සේවය හැර ගිය සහ වෙනත් හේතූන් මත සේවයෙන් ඉවත් වූ නිලධාරීන් 8 දෙනෙකුගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපළ ණය රු.මිලියන 1.77 ක් අයවීමට තිබුණි. එම දේපළ ණය ශේෂයෙන් වර්ෂ 10 සිට වර්ෂ 20 දක්වා කාලයක් තිස්සේ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දැනට සේවයේ නොමැති නිලධාරීන්ගෙන් අයවිය යුතු රු. මිලියන 3.11 ක් වූ ආපදා ණය මුදල සමාලෝචිත වර්ෂයේදී අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.5 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.5.1 විගණන හා කළමනාකරණ කමිටුව**

2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009(I) (i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයෙන් සංශෝධිත 2009 ජූනි 09 දිනැති DMA/2009(1) දරන චක්‍රලේඛයේ 06 වන ඡේදය ප්‍රකාරව ආයතන ප්‍රධානියා ආදායම් ගණන්දීමේ නිලධාරියා වන දෙපාර්තමේන්තු සෑම මාස දෙකකට වරක් බැගින් වර්ෂයකට විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 06 ක් පැවැත්විය යුතු වුවද 2016 වර්ෂය තුළ දී කමිටු රැස්වීම් 04 ක් පමණක් පවත්වා තිබුණි.

**3.5.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2017 ජුලි 11 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.6 වත්කම් කළමනාකරණය**

**(අ) නිශ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්**

(i). පොත් බැඳීම් කාර්යය සඳහා මිලදී ගත්, එකතුව රු. 1,250,000 ක් පමණ වටිනා යන්ත්‍ර 5 ක් එම යන්ත්‍රවලින් සිදුකළ හැකි මුද්‍රණ වැඩ නොමැති වීම නිසා වසර 13 ක කාලයක සිට අභාවිතව තිබුණි.

(ii). වටිනාකම නිවැරදිව නිශ්චය කළ නොහැකි යන්ත්‍ර 36 ක් යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියාවට ලක් නොකිරීම, තාක්ෂණය යල් පැනීම ආදී හේතු නිසා මාස 06 ක සිට වර්ෂ 10 ක් දක්වා කාලයක් තුළ නිෂ්කාර්යව පවතින බවට නියැදි විගණන පරීක්ෂාවකදී අනාවරණය විය. ඊට අමතරව මුද්‍රණ කටයුතු සම්බන්ධ අභාවිත යන්ත්‍රෝපකරණ

හදුනා ගැනීමට මුද්‍රණාලයාධිපති පත් කළ 2014 නොවැම්බර් 17 දිනැති වාර්තාවට අනුව නිෂ්කාර්ය යන්ත්‍ර 20 ක්ද හදුනාගෙන තිබුණි.

(iii). ආකෘති පත්‍ර ගබඩාව විසින් කුමන ආයතනයකට කොපමණ ප්‍රමාණයකින් අකෘති පත්‍ර සහ පොත් නිකුත් කර ඇත්ද යන්න කාර්යක්ෂමව තහවුරු කර ගැනීමට හැකි පරිගණක පද්ධතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පුහුණු නිලධාරීන් නොමැති වීම නිසා නිෂ්කාර්යව පැවතුණි.

(iv). රුපියල් මිලියන 12 ක පමණ මූල්‍ය වටිනාකමකින් යුතු Legislative Enactments of Ceylon, New Law Reports හා Voice from Ancient Sri Lanka යන වර්ග තුනක පොත් 2012 වර්ෂයේ සිට වර්තමානය දක්වා භාවිතා නොකර අනාරක්ෂිත ලෙස ගබඩාකර තිබුණි.

(v). දෙපාර්තමේන්තු පරිශ්‍රයේ සවිකර ඇති රු. 2,951,179 ක් වූ ස්වයංක්‍රිය ගේට්ටු පද්ධති දෙකක් වර්ෂ දෙකකට වැඩි කාලයක සිට නිෂ්කාර්යව පැවතුනි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**----------------------------------------**

2014 ඔක්තෝබර් 14 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2016 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා 2017 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, දෙපාර්තමේන්තුව විසින් එම වාර්තා 2017 ජූනි 06 වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර තිබුණේ 1989 වර්ෂයේ පවත්වා තිබුණි.

**3.7 කාර්යසාධනය**

**--------------------**

පාසල් පෙළ පොත් මුද්‍රණය

------------------------------

(i). අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබෙන පාසල් පෙළ පොත් මුද්‍රණ ඇනවුම් අඩුවීම නිසා එම තත්ත්වය යහපත් කර ගැනීමට ක්‍රමවේදයක් සකස්කර නිසි සැලැස්මක් සකස් කරන ලෙසට 2009 සැප්තැම්බර් 11 දින රැස්වූ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් දෙපාර්තමේන්තුවට දන්වා තිබුණි. එසේ වුවද සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් ඒ සඳහා නිසි සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ii). 2010 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුළදී මුද්‍රණය කිරීම පිණිස දෙපාර්තමේන්තුවට ලැබී ඇති පොත් වර්ග ප්‍රමාණය 01 සිට 06 අතර පරාසයක විචලනය වී තිබූ අතර එහි වර්ධනයක් සිදුවී නොතිබුණි.

(iii). 2017 වර්ෂය සඳහා පෙළ පොත් මුද්‍රණය සඳහා අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුවෙන් ලද ඇනවුමට අදාළ පාසල් පෙළ පොත් වර්ග 4න් 3ක්ම ප්‍රමාද වී මුද්‍රණය කර තිබුණි. ප්‍රමාද කාලය දින 01 සිට දින 31 දක්වා කාලයක් තුළ විය. 2016 වර්ෂය සඳහා පාසල් පෙළ පොත් මුද්‍රණ කටයුතුද දින 03 සිට 115 දක්වා කාලයක් තුළ ප්‍රමාදවී තිබුණි. එලෙස ප්‍රමාද වී මුද්‍රණය කරන ලද පෙළ පොත් වර්ග දෙකක් සඳහා 2017 මැයි 30 දිනට දඩ හා ප්‍රමාද ගාස්තු ලෙස රු. 1,245,367 ක මුදලක් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් අය කර තිබුණි.

## 3.8 අනාර්ථික ගනුදෙනු

(අ). 2014 පෙබරවාරි 17 දිනැති අංක PED/RED/01/04/2014/01 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අයවැය ඇස්තමේන්තුවේ සඳහන් ආදායම් ශීර්ෂය අනුව සකස් කරන ලද ක්‍රියාකාරි සැලැස්ම සහ වාර්ෂික ක්‍රියාකාරකම් අනුව අග්‍රිම ඉල්ලුම් කිරීමේ සැලැස්ම පිළියෙල කරන ලද වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මට ඇතුළත්කර නොතිබුණි. සැලැස්ම පිළියෙල කිරීම සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 34 ක ගේ සහභාගීත්වයෙන් 2016 දෙසැ. 17 හා 18 දෙදිනයන්හිදි රන්මිනිතැන්න ජාතික ටෙලි සිනමා උද්‍යානයේදී රු. 260,000 ක් පමණ වූ මුදලක් වැයකර තිබුණු බවද නිරීක්ෂණය විය.

(ආ). රාජකාරීවලට අදාළ වැඩ අධ්‍යනයක් මඟින් දෙපාර්තමේන්තුවේ මුද්‍රණ කාර්ය සහයක තනතුරට අදාළ නිසි රාජකාරි පැවරීමක් සිදු කර නොතිබුණි. ඒ නිසා මුද්‍රණ කාර්ය සහායක තනතුරේ නියුතු සේවකයින් දෙපාර්තමේන්තුවේ විවිධ කාර්යයන් ඉටු කර ඒ වෙනුවෙන් කෑලි පදනම මත විවිධ ගෙවීම් ලබා ගෙන තිබුණි. සේවකයන් 12 දෙනෙකු විසින් එලෙස කෑලි පදනම මත සමාලොචිත වර්ෂයේ දෙසැම්බර් මස රු. 138,907 ක් ලබා ගෙන ඇති බව නියැදි විගණන පරික්ෂාවේදී අනාවරණය විය.

## 3.9 කළමනාකරණ දුර්වලතා

(අ) මුද්‍රණ ඇනවුමක් ලද අවස්ථාවේ සිට එම මුද්‍රණ කටයුත්ත නිම වන අවස්ථාව දක්වා දෙපාර්තමේන්තුව තුළ ක්‍රියාත්මක වන පාලන ක්‍රමයේ පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i). මුද්‍රණ ඇනවුම භාරගන්නා අවස්ථාවේදී එම ඇනවුම නිම කළ යුතු දිනය වැනි සාධක සැලකිල්ලට ගෙන නිම කිරිම සම්බන්ධයෙන් සැලසුමක් සකස් කර නොතිබුණි.

(ii). ලැබෙන මුද්‍රණ ඇනවුමක් නිම කිරීමට දායක වන දෙපාර්තමේන්තුවේ අංශ අතර මනා සම්බන්ධතාවයක් හා මෙහෙයවීමක් සිදු නොවන බව නිරීක්ෂණය විය. ඇනවුම භාරගත් අවස්ථාවේ සිට අවසන් වන තෙක් සමස්ථ ක්‍රියාවලිය පිළිබඳ වගකිව යුතු නිලධාරීන් මඟින් අධීක්ෂණක් සිදු නොවන බව මුද්‍රණ ඇණවුම් ප්‍රමාද වී භාරදීමෙන් අනාවරණය විය.

(iii). මුද්‍රණ කාර්යය නිම කර මුද්‍රණ ඇනවුම භාරදිය යුතු දිනය පිළිබඳ පූර්ව එකඟතාවයක් සේවාදායක ආයතනය සමඟ ඇති කර ගෙන නොතිබුණි.

(ආ) පරිගණක යතුරු ලියන අංශයේ නිලධාරීන්ගේ වැඩ අධීක්ෂණය කිරිමේ පාලන ක්‍රමයේ දුර්වලතාවය නිසා පිළිවෙලින් අංක 1953/22, 1991/42, 1992/03 හා 1964/17 යන අති විශේෂ ගැසට් පත්‍ර හි පිටු 07 ක්, පිටු 10 ක්, පිටු 08 ක් සහ පිටු 12 ක් යතුරු ලියනය කිරිම සඳහා පැය 42.5, පැය 116.75, පැය 57.5 හා පැය 115.5 ක කාලයක් නිලධාරීන් ගත කර තිබු බව නියැදි විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඇ) 2009 සැප්තැම්බර් 11 දින රැස්වූ රාජ්‍ය ගිණුම් කාරක සභාව විසින් සේවක දිරි දීමනා ගෙවීම් පිළිබඳ ක්‍රමවේදයක් සකස් කරන ලෙසට දන්වා තිබුණි. නමුදු විගණිත දින වන ජුනි 2017 19 දින තෙක් එම කාර්යය නිමකර නොතිබුණි.

(ඈ) 1981 දෙසැම්බර් 16 දින පැවැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ තිරණයකට අනුව ඇතැම් වැඩ කොටස් සඳහා අතිකාල දිමනා වෙනුවට වැඩ කොටස අනුව ගෙවීමේ ක්‍රමයක් (Piece Rate) සඳහා අනුමැතිය ලබා දි තිබුණි. ඒ අනුව එම ක්‍රමය යටතේ ක්‍රියාත්මක

කළ හැකි නිශ්චිත වැඩ කොටස කවරේද යන්න භාණ්ඩාගාරය විසින් රජයේ මුද්‍රණාලයාධිපති සමඟ සාකච්ඡා කර තීරණය කළ යුතුව බවට දක්වා තිබුණි. එසේ වුවද වර්ෂ 35 ක් ඉක්මවා තිබූ එම නිශ්චිත වැඩ කොටස් හඳුනාගෙන නොතිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ පුහුණු අවශ්‍යතා හඳුනාගෙන සමාලෝචිත වර්ෂය සඳහා පුහුණු වැඩසටහනක් සකස් කර නොතිබුණි.

(ඊ) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හැදෑරීමට දෙපාර්තමේන්තුවේ කාර්යය මණ්ඩලය තෝරා ගැනීමේදී නිශ්චිත පදනමක් හඳුන්වාදී නොතිබුණි.

**3.10 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------------**

අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

-----------------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරේක සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i). | ජ්‍යෙෂ්ඨ මට්ටම | 37 | 20 | 17 | - |
| (ii). | තෘතියික මට්ටම | 8 | 3 | 5 | - |
| (iii). | ද්විතියික මට්ටම | 1234 | 638 | 596 | - |
| (iv). | ප්‍රාථමික මට්ටම | 694 | 544 | 150 | - |
| (v). | වෙනත් (කොන්ත්‍රාත් පදනම) | 0 | 10 | - | 10 |
| | | 1973 | 1215 | 768 | 10 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මුද්‍රණ ක්ෂේත්‍රය නව තාක්ෂණය සමඟ සීඝ්‍රයෙන් දියුණුවන ක්ෂේත්‍රයක් බැවින්, මුද්‍රණ දෙපාර්තමේන්තුවේ එක් එක් අංශය වෙත අනුයුක්ත කළ යුතු කාර්යය මණ්ඩලය නිසි වැඩ අධ්‍යනයකින් හඳුනාගෙන නොතිබුණි.

(ආ) පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ සහකාර ලේකම් (කම්කරු සබඳතා) තනතුරට රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ කණිෂ්ඨ සේවකයකු 2015 මැයි 15 දින සිට අනුයුක්ත කර තිබුණි.